# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1794/11 - 2013 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2013.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තිය යටතේ දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව වෙත පැවරී ඇති කරන ලදුව මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් කරන තීරණ ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 29(3) වැනි වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණ 2013.01.01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,<br>
ලේකම්,<br>
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 15 වැනි දින,<br>
කොළඹ 05.

*උපලේඛනය*

දුම්කොළ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව, 1966 අප්‍රේල් මස 28 වැනි දින අංක 14,629/6 දරන *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ* පළවූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, කලින් කලට වෙනස් කරන ලද්දා වූ ද, අවසන් වරට 2010 ජූනි මස 30 දින අංක 1660/35 දරන *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දා වූ ද, තීරණ එම උපලේඛනයෙහි 11 කොටස වෙනුවට පහත කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් සංශෝධනය කළ යුතුය.

*II කොටස*

කම්කරුවකු (පිරිමි/ගැහැණු) වෙනුවෙන් වැඩ කරන සාමාන්‍ය දිනකට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණය රු. 500.00 කි.

02-242

1A - PG 001530 — 1090 (2013/01)

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පෙර පාසල් සේවා කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33 (1) (අ) වගන්තිය යටතේ කම්කරු ඇමැතිවරයා විසින් පනවනු ලැබ 2000 පෙබරවාරි මස 21 දින අංක 1120/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ ඇය විසින් පෙර පාසැල් සේවා කර්මාන්තයේ නියුක්ත ගුරුවරුන් සහ සහායකයින් සම්බන්ධයෙන් පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන ලද තීරණය ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33 (3) වන වගන්තිය සමග කියවෙන 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,
ලේකම්,
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

කම්කරු කොමසාරිස් විසින් පෙර පාසැල් කර්මාන්තයෙහි නියුතු කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා අවම වේතනවලට අදාළව කරන ලද 2000 ජූනි 30 වැනි දින අංක 1138/29 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තාවූ ද කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට 2010 මැයි මස 31 වැනි දින අංක 1656/10 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

| *පළමුවන තීරය (ප්‍රදේශය)* | *දෙවන තීරය (වෘත්තිය)* | *තුන්වන තීරය (අවම මාසික වේතනය)* රු. ශ. |
|---|---|---|
| මහ නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන් | 9,750 00 |
| | (ආ) සහායකයින් | 7,500 00 |
| නගර සභා සීමාව තුළ | (අ) ගුරුවරුන් | 8,740 00 |
| | (ආ) සහායකයින් | 6,975 00 |
| ප්‍රාදේශීය සභා සීමාව තුළ | (අ) ගුරුවරුන් | 7,050 00 |
| | (ආ) සහායකයින් | 5,740 00 |

ඉහත (ආ) සළකුණෙන් දැක්වෙන සේවාවන්ට මතු කී ඉහත (අ) සළකුණෙන් දැක්වෙන සේවාවලට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ හෝ වෙනත් කිසියම් සේවාවක් වේ නම් ඒවා ද ඇතුළත් වේ.

02-243

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 33(1) (අ) වැනි වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් පනවනු ලැබ 1979 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 58 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ආඥාවෙන් කම්කරු කොමසාරිස් වෙත පවරනු ලැබූ බලය අනුව, ඉහත කී ආඥාපනතේ 33(2) වගන්තිය යටතේ ඇය විසින් වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නියුක්ත කම්කරුවන් සම්බන්ධයෙන් මීට යාකොට ඇති උපලේඛනයේ දැක්වෙන කාල මිම්මේ වැඩ සඳහා අවම වේතන ප්‍රමාණය පිළිබඳව කරන තීරණය කම්කරු හා කම්කරු සබඳතා ඇමතිතුමන් විසින් අනුමත කරන ලද බව එකී ආඥාපනතේ 33 (3) වන වගන්තිය සමග කියවෙන 29(3) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම තීරණය 2013 ජනවාරි මස 01 වැනි දින සිට වලංගු විය යුතු ය.

ඩබ්. ජේ. එල්. යූ. විජයවීර,<br>
ලේකම්,<br>
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යාංශය.

2013 ජනවාරි මස 15 වැනි දින,<br>
කොළඹ 05.

**උපලේඛනය**

කම්කරු කොමසාරිස් විසින් වීදුරු භාණ්ඩ නිපදවීමේ කර්මාන්තයෙහි නියුක්ත කම්කරුවන්ගේ කාල මිම්මේ වැඩ සඳහා අවම වේතනවලට අදාළව කරන ලද 1980 ජුනි 26 වැනි දින අංක 94/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරනු ලැබූ නිවේදනයේ උපලේඛනයේ විස්තරාත්මකව දක්වා ඇත්තා වූ ද කලින් කල වෙනස් කරන ලද්දා වූ ද අවසන් වරට 2010 මැයි මස 31 වැනි දින අංක 1656/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ ද තීරණ එම උපලේඛනයට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කරනු ලැබේ.

වීදුරු භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයෙහි නියුක්ති 1 වැනි තීරුවේ සඳහන් කම්කරුවන් හට කාල මිම්මේ වැඩ වෙනුවෙන් අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය 11 වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන පරිදි විය යුතුය.

| | *1 වැනි තීරය*<br>*සේවක පන්තිය* | *11 වැනි තීරය*<br>*වැඩ කරන දවස් සඳහා වූ*<br>*වේතන ප්‍රමාණය*<br>*රු. ශත* |
|---|---|---|
| (අ) | පිඹුම්කරු, යන්ත්‍රකරු | 510 00 |
| (ආ) | සහාය යන්ත්‍ර ක්‍රියාකරු බුබුලුකරු, කැපුම්කරු, සහාය පිඹුම්කරු, උඳුන්කරු | 450 00 |
| (ඇ) | ගිනියම්කර මට්ටම් කරන්නා, හුලං ගහන්නා, බර ඇසුරුම්කරු, සහාය බුබුලුකරු | 427 50 |
| (ඈ) | කණිෂ්ඨ බුබුලුකරු, හැඩ සමකරන්නා, හරවන්නා, ගණන් කරන්නා | 412 50 |
| (ඉ) | කැපුම්කරු, විමිනි කැපුම්කරු, මට්ටම්කරු | 397 50 |
| (ඊ) | ඇසුරුම්කරු, ගෙනයන්නා | 375 00 |

වැඩ කරන සාමාන්‍ය දවස<br>
සාමාන්‍ය දවසක් (කෑම ගැනීම, තේ විවේකය සඳහා පැයක් ඇතුළුව)

| | | |
|---|---|---|
| (අ) | සෙනසුරාදා හැර වෙන ඕනෑම දවසක් | පැය 9 |
| (ආ) | සෙනසුරාදා දවසක | පැය 6 |

02-244

# නිවැරදි කිරීමයි

**පඩිපාලක සභා ආඥාපනත**

මුද්‍රණ කර්මාන්තය

2012.12.18 වැනි දින අංක 1789/19 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට්* පත්‍රයේ I කොටස : I ඡෙදය - සාමාන්‍ය රජයේ නිවේදන යටතේ ඉහත මාතෘකාවෙන් අංක 65/2 දරන දැන්වීමේ 2A පිටුවේ "මෙම තීරණ 2013.07.07 වැනි දින සිට වලංගු විය යුතු ය" යන්න මුද්‍රණ දෝෂයක් හේතුවෙන් මුද්‍රණය වී ඇති අතර එය "මෙම තීරණ 2013.01.01 වැනි දින සිට වලංගු විය යුතු ය"ග ලෙස නිවැරදි විය යුතු ය.

ආර්. ඩබ්ලිව්. කුලරත්න බණ්ඩාර,
*වැඩ බලන කම්කරු කොමසාරිස්.*

2013 ජනවාරි මස 21 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුව.

02-257

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.